74-75 Sinhala 30-03-2004 11:37 Pagina 74

*Intervention 2004, Volume 2, Number 1, Page 74 - 75*
*Abstracts in Sinhala*

# Abstracts in Sinhala

## <u>ක්ෂතිමය අත්දැකීම් ගැන කථා නොකිරීම: හානිකර ද සුවදායි ද ? නිරිතදිග උගන්ඩාවේ යුද්ධය ගැන ස්මරණයන් සමග පොරබැදීම</u>

1986 සිට උගන්ඩාවේ නොයෙක් ප්‍රදේශවල සාමය පැවතුනු නමුදු නිරිතදිග උගන්ඩාවේ එම්බරාරා දිස්ත්‍රික්කයේ ජීවත්වන කිසිවෙක් යුද්ධයේ අත්දැකීම ගැන කථා නොකරති. මුනිවත රැකීමේ එකම මහා කුමන්ත්‍රණයක් පවතී. එම ජනයාට අනුව ඒ ගැන කථා කිරීම හොඳ දෙයක් නොවේඵ එය භයානක දෙයක් විය හැකියඵ ඒනිසා ඔබ ලෙඩ විය හැකිය. ඔවුන් තම බියකරු අත්දැකීම ගැන මුනිවත රැකීමට හේතුව මෙම ලිපියෙන් විභාග කෙරේ. එහි ප්‍රජාව හා සමාජ සහ සංස්කෘතික සංස්ථා විනාශ වී ගොස් ඇති බව පෙනේ. යුද්ධය ගැන තම මතකයන් බෙදා හදා ගැනීමට පොදු අවකාශයක් ජනතාව සතුව නොමැත. ආර්ථික, දේශපාලන සහ මනෝවිද්‍යාත්මක අංග සමග එක්ව සලකා බලන විට කළ යුතු හොඳම දෙය නිශ්ශබ්දව සිටීම යැයි තීන්දු කෙරෙන තත්ත්වයක් නිර්මාණය කෙරෙනු ඇත.

ප්‍රධාන වචන : නිශ්ශබ්දතාවය, ක්ෂතිය, උගන්ඩාව, පශ්චාත්-යුද්ධ කාලය, ප්‍රජාව

## <u>ළමා කථා කීමට හෙළිදරව් කිරීමේ සායනය, ආඛ්‍යානය සහ හෙළිදරව් වීම ගැන අවස්ථා අධ්‍යයනක්</u>

මෙම ලිපියෙහි ක්ෂතියට පත් වූ ළමයින් සඳහා උපයෝගී කර ගත හැකි මනෝචිකිත්සන ක්‍රමයක් විස්තර කරනු ලැබේ. මෙම ප්‍රවිශ්ටය ක්ෂතියට භාජනය වූ වැඩිහිටියන් සඳහා කථා කිරීමට හෙළිදරව් කිරීමේ සායනය නමැති විධික්‍රමය මතය. ණෂාහැඹ ක්‍රමය ගැන විස්තරයක් සහ ඉතාමත් ම බරපතල ලෙස ක්ෂතියට භාජනය වූ 15 හැවිරිදි ළමයෙක් මේ ක්‍රමය මගින් සුව කිරීම ගැන සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කෙරී ඇත.

ප්‍රධාන වචන : ළමයා, සංජානනාත්මක හැසිරීම්, කථා කීමට හෙළිදරව් කිරීමේ සායනය, හැඹ මනෝ ක්ෂති, සරණාගත ළමෝ, සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වය, යුද්ධය, සෝමාලියාව

---

## <u>ඇෆ්ගනිස්ථානයේ සෞඛ්‍ය සේවා ක්‍රියාකාරීන් වෙනුවෙන් මූලික මානසික සෞඛ්‍යය සඳහා මොඩියුල සකස් කිරීම</u>

පිටර් වෙන්ටෙවොගෙල් සහ ප්‍රැන්ක් කෝට්මන්

මේ ලිපියෙහි අපි නැගෙනහිර ඇෆ්ගනිස්ථානයේ සාමාන්‍ය සහ මූලික සෞඛ්‍ය සේවා ව්‍යාපෘතියකදී වෛද්‍යවරු, හෙදියන්, වින්නඹුවන් සහ ස්වේච්ඡා ගැමි සෞඛ්‍ය සේවකයින් සඳහා මානසික සෞඛ්‍ය පුහුණුවීමේ මොඩියුල වර්ධනය කිරීමේ අප අත්දැකීම් විස්තර කරමු. මෙම ලිපිය, සෞඛ්‍ය සේවකයින් සඳහා මානසික සෞඛ්‍ය සේවා පුහුණු කිරීමේ මොඩියුල වර්ධනය කිරීමේ දී උපයෝගී කළ හැකි සම්පත් සඳහා ආශ්‍රේයයන් දක්වයි.

ප්‍රධනා වචන : මානසික සෞඛ්‍යය, පුහුණුව

## අවිනිශ්චිතබවට මුහුණදීම : බටහිර රටක සරණාගතයින් ප්‍රශ්නවලට මුහුණ දෙන ආකාරය

රැකවරණය සොයා බටහිර රටකට පැමිණි අය රඳවා සිටින මධ්‍යස්ථානයක් තුළ ජීවත්වීමේ අර්ථය කුමක් ද? තමා වැටී සිටින තත්ත්වය ගැන ඔවුන් සිතන්නේ කුමක් ද? ඔවුන්ගේ හැඟීම් කවරේ ද? මේ සියලුම දෙනා මෙම දීර්ඝ අවිනිශ්චිත කාලය තුළ දී තම රැකවරණ ලියකියවිලි ලැබෙන තෙක් බලා සිටීමේදී ඔවුන් තම අත්දැකීම් වටහා ගන්නේ කුමනාකාරයෙන් ද? මේ සියලු දෙනාම යුද්ධය, දඬුවමට ලක්වීම, මානව අයිතීන් උල්ලංඝණය කිරීම සහ අනතුරුදායක තත්ත්වයන් හා තර්ජන වැනි දේවලට මුහුණ දීමෙන් පසුව නොයෙක් රටවලින් පැමිණි අය ය. ඔවුන් ප්‍රශ්නයට බඳුන් කරන්නේ හෝ තර්ජන ලෙස දකින්නේ කුමන වත්මන් නිරීක්ෂණ, අපේක්ෂාවන් හෝ මතකයන් ද? තත්ත්වයට මුහුණදීමේ සහ ප්‍රශ්නවලට මුහුණදීමේ මෝස්තරවලට අර්ථයක් දීමේ දී වෙනත් මෝස්තර අපට දැක ගත හැකි ද?

ප්‍රධාන වචන : රැකවරණ සොයන්නෝ, ප්‍රශ්නවලට මුහුණදීම, ගුණාත්මක පර්යේෂණ, සරණාගතයෝ

## කථා කුඩාරම

කථා කුඩාරම යනු සරණාගත ළමයින් කථා කීමේ සහ සමාජ අන්තර් ක්‍රියාකාරිත්වයෙහි යෙදවීමේ විධික්‍රමයකි. .කුඩාරම. සහ .කථාගල. ආරක්ෂිත වූත් ව්‍යූගත වූත් වාතාවරණයක් නිර්මාණය කරයි. කථාවක් ගෙතීමේදී විවිධ ක්‍රම ගැන සාකච්ඡා කෙරේ. කථාවල් සමග පොර බැදීමේදී ළමයි තම පරිකල්පනය වටිනා වූ දරා ගැනීමේ මූලෝපායක් ලෙස පාවිච්චි කරන ආකාරය සොයා ගනිති. වෙනත් සෑම හොඳ විධික්‍රමයක් තමන් ම .කථා කුඩාරම. ද ඊට සහභාගි වූ ළමයින් සමග අන්තර්ක්‍රියාකාරිත්වය තුළින් විකාශනය විය.

ප්‍රධාන වචන : නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ළමයින්, කථා කීම, පරිකල්පනය.

## ඉතියෝපියානු මුක්ත-භටයින්ගේ ගැටළු

මෙම ලිපිය ඉතියෝපියාවේ මුක්ත-භටයින් සිවිල් සමාජයට යළි ඒකාබද්ධවීමේදී මුහුණ දෙන ගැටළු සාකච්ඡා කරයි. මානව විද්‍යාත්මක ක්ෂේත්‍ර අධ්‍යයනයක දී මුක්ත-භටයින් **60** දෙනෙක් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ඉතියෝපියාවේ ජනතාව ද ඉතියෝපියානු සහ බටහිර රජයේ-නොවන- සංවිධාන ද තම ජීවන තත්ත්වයන් ගැන උනන්දු නොවන බවට ඔව්හු පැමිණිලි කළහ. ඔවුන්ට තම අනාගතය ගැන ඉදිරි දර්ශනයක් නැති බව පෙනේ. එච්අයිවී/ඒඩ්ස් රෝගය වැළඳී ඇත්තාවූ ද අපරාධකාරී ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙන්නා වූ ද සමහර මුක්ත-භටයින් ගැන තමන් දන්නා බව සමහර අය පැවසූහ.

ප්‍රධාන වචන : මුක්ත-භටයෝ, යළි ඒකාබද්ධ කිරීම.